**නිපුණතා සංවර්ධන, වෘත්තීය අධ්‍යාපන, පර්යේෂණ හා නව නිපැයුම් රාජ්‍ය අමාත්‍යාංශය**

# තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව

# ජාතික වෘත්තීය සුදුසුකම් ක්‍රමයේ (NVQ) ඇගයීම්කරුවන් බඳවා ගැනීම.

ජාතික වෘත්තීය සුදුසුකම් ක්‍රමයේ ඇගයීම්කරුවන් පුහුණු කිරීමට හා පත්වීම ලබා දීම සඳහා තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් කර්මාන්තයේ නියුතු වෘත්තිකයන්ගෙන් හා පුහුණුකරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලබයි. කොමිෂන් සභාව විසින් තෝරාගන්නා අයදුම්කරුවන් ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ)1-4 මට්ටම සඳහා නිපුනතා පාදක ඇගයීම් පැවැත්වීම පිළිබඳව පුහුණු කෙරේ. පුහුණුව සාර්ථක ලෙස සම්පූර්ණ කරන අයදුම්කරුවන් ජාතික වෘත්තීය සුදුසුකම් පිළිබඳ ඇගයීම්කරුවන් ලෙස කොමිෂන් සභාව යටතේ ලියාපදිංචි කරනු ලබන අතර අවශ්‍ය අවස්ථාවන්හිදී පැවරුම් පදනම මත ඔවුන් NVQ 1-4 මට්ටම දක්වා ඇගයීම් කටයුතුවල නියැලිය යුතුය.

**සුදුසුකම්**

1. අදාළ ක්ෂේත්‍රයෙහි පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබා ගත් උපාධියක් හෝ පිළිගත් වෘත්තිමය ආයතනයකින් පිරිනමනු ලබන ඒ හා සමාන සුදුසුකමක් සමග වෘත්තියට අදාළව වසර 3 ක සේවා පළපුරුද්ද.

හෝ

2. අදාළ ක්ෂේත්‍රයෙහි අවම වශයෙන් වසර 2ක පූර්ණකාලීන ඩිප්ලෝමාවක් සමග වෘත්තියට අදාළව වසර 5ක සේවා පළපුරුද්ද.

හෝ

3. වෘත්තියට අදාළව NVQ 4 සුදුසුකමක් සමග පුහුණුකරුවකු ලෙස අදාළ වෘත්තියේ අවුරුදු 8 ක් කටයුතු කර තිබීම

හෝ

4. වෘත්තියට අදාළව NVQ 4 සුදුසුකමක් සමග අදාළ වෘත්තියේ අවුරුදු 8 ක් කටයුතු කර තිබීම.

හෝ

5. කාර්මික විද්‍යාල / ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය / වෘත්තීය පුහුණු කිරීමේ අධිකාරිය යන ආයතනයන්හි හෝ තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ ලියාපදිංචි වෙනත් පුහුණු ආයතනයක අයදුම් කරන ක්ෂේත්‍රයට අදාළ තාක්ෂණික මට්ටමේ පාඨමාලාවක් සාර්ථක ලෙස හදාරා අවසන් කිරීම සමග අදාළ වෘත්තියේ අවුරුදු 8 ක් කටයුතු කර තිබීම.

හෝ

6. අදාළ වෘත්තියේ වසර 20 කට නොඅඩු හෝ සේවා කාලයක් සපුරා තිබීම. (විශ්‍රාමිකයන් සඳහා ප්‍රමුඛතාවය දෙනු ලැබේ. ලිපිකරු (සාමාන්‍ය) වෘත්ති සඳහා පමණි.)

**නව ඇගයීම්කරුවන් බඳවා ගන්නා වෘත්තීන් පහත දැක්වේ.**

1. ක්ෂේත්‍ර සහායක (කෘෂිකාර්මික) - FIELD ASSISTANT (AGRICULTURE)
2. ප්‍රජා සෞඛ්‍ය ප්‍රවර්ධන සහායක - COMMUNITY HEALTH ASSISTANT
3. රියදුරු - DRIVER
4. සාත්තු සේවය - CAREGIVER
5. මත් ද්‍රව්‍ය නිවාරණ කටයුතු සහායක - DRUG PREVENTION ASSISTANT
6. ග්‍රාමීය ආපදා කළමනාකරන සහායක - DISASTER RISK EDUCATION ASSISTANT
7. පැල තවාන් සංවර්ධන සහායක - PLANT NURSERY DEVELOPMENT ASSISTANT
8. ආරක්ෂක නිලධාරි - SECURITY OFFICER
9. වෙළඳසැල් සේවා සහායක - CUSTOMER SERVICE ASSISTANT
10. බංගලා සහායක - ASSISTANT BUNGALOW KEEPER

එමෙන්ම මෙම වෘත්තීන්ට අමතරව තවත් වෘත්තීන්ඇති අතර www.tvec.gov.lk දරන වෙබ් අඩවියෙන් මෙම වෘත්තීන් පිළිබඳව දැනුවත් විය හැකිය. දැනටමත් ලියාපදිංචි වී ඇති ඇගයුම්කරුවන් වෙනත් වෘත්තීන් පිළිබඳවද උනන්දුවක් දක්වන්නේ නම් නැවත ඉල්ලුම් කළ යුතුය.

**අයදුම් කළ යුතු ආකාරය**

- www.tvec.gov.lk දරන වෙබ් අඩවියෙන් හෝ කොමිෂන් සභා කාර්යාලයෙන් අයදුම් පත්‍රය ලබා ගත හැකිය.
- අයදුම්කරුවන් විසින් අයදුම් පත්‍රය ලියාපදිංචි කිරීමේ ගාස්තුව ලෙස රු.500.00 ක් මුදල බැංකුවට ගෙවන ලද රිසිට්පත අයදුම්කරු විසින් අයදුම් පතට ඇමිණිය යුතුය."අධ්‍යක්ෂ ජනරාල්,තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව" යන නමින් යුත් අංක **078 1001-72266044** දරන ගිණුමට බැරවෙන ලෙස මහජන බැංකුවේ ඕනෑම ශාඛාවකට මුදල් ගෙවිය හැක. මුදල් ගෙවීමේදී මුදල් ගෙවන අයගේ. නම පැහැදිලිව සඳහන් කළ යුතුය.
- සම්පූර්ණ කරන ලද අයදුම්පත් එවිය යුතු ලිපිනය

  අධ්‍යක්ෂ ( තත්ත්ව ආරක්ෂණ හා ඇගයීම් පාලන )

  තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව

  නො. 354/2, ඇල්විටිගල මාවත, නාරහේන්පිට, කොළඹ 05.

- අයදුම්පත් එවන ලබන ලියුම් කවරයෙහි වම් පස ඉහළ කෙලවරේ "NVQ ඇගයීම්කරුවන්" ලෙස සඳහන් කළ යුතුය

පැහැදිලිකර ගැනීම් හා වැඩිවිස්තර සඳහා 011-7608082 අමතා අධ්‍යක්ෂ (තත්ත්ව ආරක්ෂණ හා ඇගයීම් පාලන) හෝ 077-7608077 අමතා නියෝජ්‍ය අධ්‍යක්ෂ මඟින් ලබා ගත හැක.

**අධ්‍යක්ෂ ජනරාල්**
**තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව.**

**තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව,**
**නො 354/2, ඇල්විටිගල මාවත,**
**නාරහේන්පිට, කොළඹ 05.**
**30.11.2021**